# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1462/10 – 2006 සැප්තැම්බර් 12 වැනි අඟහරුවාදා – 2006.09.12

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක 07

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1) (අ) වගන්තිය යටතේ විධානය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් රන්මිණි කුලරත්න ජයසූරිය වන මම, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) (අ) වගන්තිය යටතේ ක්‍රියා කරමින්, යම් නිෂ්පාදකයෙකු, ආනයනකරුවකු, නියෝජිතයකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු හෝ විසින් කිසියම් භාණ්ඩයක් හෝ භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධයෙන් පුවත්පත්, චිත්‍රපට, රූපවාහිනිය, වීඩියෝ, ඔඩියෝ, ගුවන්විදුලිය, අන්තර්ජාලය හෝ වෙනයම් මුද්‍රිත, විද්‍යුත් හෝ ඉලෙක්ට්‍රොනික් මාධ්‍යවල පළ කරනු ලබන හෝ පළ කරවනු ලබන සෑම වෙළෙඳ දැන්වීමකම, එම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් භාණ්ඩයේ හෝ භාණ්ඩවල සිල්ලර මිල, එම නිෂ්පාදකයා, ආනයනකරු, නියෝජිතයා, බෙදාහරින්නා හෝ වෙළෙන්දා හෝ විසින් එම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් කළයුතු බවද, එම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ විවිධ මෝස්තර, ප්‍රමාණ, වර්ග හෝ ශ්‍රේණි හෝ අනුව එහි සඳහන් කර ඇතොත් එසේ සඳහන් කර ඇති එම භාණ්ඩයේ හෝ භාණ්ඩවල එක් එක් මෝස්තරයක්, ප්‍රමාණයක, වර්ගයක හෝ ශ්‍රේණියක හෝ සිල්ලර මිල වෙන් වෙන් වශයෙන් දැක්වෙන පරිදි එම භාණ්ඩයෙහි හෝ භාණ්ඩවල සිල්ලර මිල එම නිෂ්පාදකයා, ආනයනකරු, නියෝජිතයා, බෙදාහරින්නා, හෝ වෙළෙන්දා හෝ විසින් එම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් කළ යුතු බවද, සියලුම නිෂ්පාදකයින්ට, ආනයනකරුවන්ට, නියෝජිතයින්ට, බෙදාහරින්නන්ට හා වෙළෙන්දන්ට මෙයින් විධාන කරමි.

මෙම විධානය 2007 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රන්මිණි කුලරත්න ජයසූරිය,
අධ්‍යක්ෂ ජනරාල්,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

2006 සැප්තැම්බර් මස 05 වැනි දින,
අංක 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

09 – 812


IA-PG 000618 -510 (2006/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.